ජාතික ඉතිරි කිරීමේ බැංකුව-2013

-----------------------------------

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිතයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර බැංකුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. බැංකුවේ ශාඛා 15 ක විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී වරලත් ගණකාධිකාරී සමාගම් 15 ක් මට සහාය වන ලදී. පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන පරිපාලිතයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලදී. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2014 ඔක්තෝබර් 09 දින ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපතිනිය වෙත නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරිම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය - බැංකුව

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### මතය - සමූහය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා

මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**------------------------------------------**

**2.2.1 සමූහ මූල්‍ය ප්‍රකාශන**

**------------------**

බැංකුවේ සම්පූර්ණ අයිතිය සතු පරිපාලිතය වන "නැෂනල් සේවිංස් බැන්ක් ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ්" සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන , ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදා කර ගන්නා ලදි.

**2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අක්‍රීය ගිණුම් වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.659,014,723 ක මුදලකින් රු.281,079,089 ක් වර්ෂ පහකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට වංචනික ආපසු ගැනීම් රු.23,193,414 ක් වූ අතර, එයින් රු.12,435,981 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඇ) ගනුදෙනු කරුවන්ට ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු මුළු හිඟ ශේෂයෙන් සියයට 42 ක් නියෝජනය වූ රු.3,583,416 ක් ආපසු ගෙවීමෙන් තොරව වර්ෂ තුනකට වැඩි කාලයක් පරිශේෂව පැවතුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට මුදල් අයකැමි ඌනතාවය රු.1,645,074 ක් වූ අතර එයින් රු.1,561,972 ක් වර්ෂයකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඉ) වර්ෂ පහකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව රු.2,699,061 ක ශේෂයක් තැන්පතු නිෂ්කාෂණ ගිණුමේ පැවතුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 47 වගන්තිය | අක්‍රීය බැංකු ගිණුමක් පවතින අවස්ථාවකදී එම ගිණුම්වල පවතින මුදල් "හිමිකම් නොපෑ තැන්පතු සංචිතය" කට මාරු කළ යුතුය. කෙසේ වුවද, මෙම විධිවිධානයට බැංකුව අනුකූල වී නොතිබුණි. |
| (ආ) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත සහ 2000 ජනවාරි අංක පීඑෆ්/පීඊ/06 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2013 වර්ෂය සඳහා උපයන විට ගෙවීම් බදු ලෙස රු.63,498,213 ක මුදලක් අදාළ සේවකයින්ගේ වැටුප්වලින් අයකර ගැනීමෙන් තොරව බැංකුව විසින් එහි අරමුදල්වලින් ගෙවා තිබුණි. |
| (ආ) 2007 අංක 10 දරන පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | (i) අවස්ථා 82 කදී ශාඛා 6 ක් විසින් ගිණුම් විවෘත කිරීමේදී ඉල්ලුම් පත්‍රය සමඟ ආදායම් බදු ප්‍රකාශන ගනුදෙනුකරුවන්ගෙන් ලබාගෙන නොතිබුණි.<br><br>(ii) බදු අයකළ හැකි ආදායම රු.500,000 නොඉක්මවන බව දක්වමින් බදු ප්‍රකාශන ගනුදෙනුකරුවන් 6 ක් විසින් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද ඔවුන්ගේ තැන්පතු ගිණුම්වලට බැර කරන ලද මුළු පොලී ආදායම එම මුදල ඉක්මවා තිබූ අතර එහි එකතුව රු.2,868,363 ක් විය. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 පරිච්ඡේදයේ 5.2.4 ඡේදය | මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා කෙටුම්පත් අයවැය ලේඛනය ඉදිරිපත් කළ යුතු වුවද, පසුගිය වර්ෂ 5 වෙනුවෙන් වූ අයවැය ලේඛන සඳහා අනුමැතිය ලබා ගැනිමේදී බැංකුව එම චක්‍රලේඛයට අනුකූල වී නොතිබුණි. |
| (ඉ) | 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 6 දරන චක්රලේඛයෙන් සංශෝධිත 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ<br>--------------------------------------------- | |
| | (i) 4.2.1 මාර්ගෝපදේශය | 2013 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| | (i) 4.2.2 මාර්ගෝපදේශය | 2013 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කාල උපලේඛනයේ අවශ්‍ය පරිදි පිළියෙල කර නොතිබුණි. |
| | (iii) 8.9.3 මාර්ගෝපදේශය | වටිනාකම රු.500,000 වැඩි කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතුය. කෙසේ වුවද අවස්ථා 6 කදී රු.124,029,624 ක් වටිනාකම වූ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා මෙම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 2,279 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 6,340 ක් වූයෙන් රු. මිලියන 4,061 කින් හෙවත් සියයට 64 කින් මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් දැක්වුණි. මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීම සඳහා පොලී ආදායම වැඩිවීමට වඩා පොලී පිරිවැය සැලකිය යුතු ලෙස වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ පරිපාලිතයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 390 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 52 ක් වූයෙන් රු. මිලියන 338 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමක් දැක්වුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, පෙර වර්ෂය හා ආංශික අනුපාතයන් සමඟ සැසඳීමේදී බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත වගුවෙන් දැක්වේ.

| | අංශ අනුව අනුපාත | 2013 | 2012 |
|---|---|---|---|
| (අ) ලාභදායිත්ව අනුපාත | | | |
| (i) සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (හිමිකම්) (%) | 9.5 | 5.15 | 16.07 |
| (ii) සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ % | 0.9 | 0.39 | 1.30 |
| (iii) ශුද්ධ පොලී ආන්තිකය | 1.43 | 1.7 | 2.7 |
| (ආ) <u>ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය</u> | | | |
| මුළු වත්කම් වලට හිමිකම් | 1:18.83 | 1:29.45 | 1:21.41 |

| | | | |
|---|---|---|---|
| (ඇ) <u>ද්‍රවශීල වත්කම් අනුපාතය</u> | | | |
| ද්‍රවශීලතා අනුපාතය (%) | 69.53 | 92.7 | 69.5 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ හිමිකම් මත ප්‍රතිලාභ, සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ හා ශුද්ධ පොලී ආන්තිකය පිළිවෙලින් සියයට 67.95 කින්, සියයට 70 කින් හා සියයට 37.04කින් අඩුවී තිබුණු අතර ද්‍රවශිලතා අනුපාතය සියයට 33.38 කින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 බැංකුවේ කාර්ය සාධනය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ මෙහෙයුම් කාර්ය සාධනය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | 2013 | 2012 |
|---|---|---|
| ශාඛා සංඛ්‍යාව | 229 | 219 |
| තැපැල් ශාඛා සංඛ්‍යාව | 4,063 | 4,053 |
| ගිණුම් හිමියන් සංඛ්‍යාව (මිලියන) | 17.9 | 17.4 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 247 | 231 |
| පාසැල් බැංකු ඒකක | 1,723 | 1,185 |

සමාලෝචිත වර්ෂය තුළදී නව ශාඛා 10 ක් ස්ථාපිත කර තිබූ අතර, ගිණුම් හිමියන් සංඛ්‍යාව දළ වශයෙන් 500,000 ක් වැඩිවී තිබුණි. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය සමාලෝචිත වර්ෂය තුළදී 231 සිට 247 දක්වා වැඩිවී තිබුණි.

**(අ) 2013 වර්ෂය සඳහා ලාභ සහ පාඩු සහිතව පවත්වාගෙන ගිය ශාඛා**

(i) 2013 වර්ෂය සඳහා බැංකුවේ බදුවලට පසු ලාභය රු.මිලියන 1,184 ක් විය. 2012 වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 69 කින් හෙවත් රු.මිලියන 2,579 කින් සැලකිය යුතු අඩුවීමක් වී තිබුණි.

(ii) ශාඛා 33 ක් හා අංශ 2 ක් 2012 හා 2013 වර්ෂ වලදී පිළිවෙලින් රු.207,872,445 ක හා රු.148,024,445 ක අඛණ්ඩ පාඩු මත පවත්වා ගෙන තිබුණි.

(iii) ශාඛා 43 ක් හා අංශ 2 ක් 2013 වර්ෂය තුළදී දරන ලද මුළු පාඩුව රු.209,563,299 ක් විය.

**4.2 ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම - 2013**

**-----------------------------------------------**

2012 දෙසැම්බර් 19 දිනැති අංක 12/1767/504/163 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, එජඩො මිලියන 1,000 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කර එමගින් ලැබෙන මුදල් යටිතල සංවර්ධන ව්‍යාපෘති සඳහා ණයලබාදීම වෙනුවෙන් උපයෝජනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව වාර්ෂිකව සියයට 8.875 ක පොළී අනුපාතයකට එජඩො මිලියන 750 ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර බැංකුව විසින් 2013 සැප්තැම්බර් 18 දින නිකුත් කරන ලදි.
මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍ය මණ්ඩල තීරණය සහ බැංකුවේ යෝජනා කොන්දේසි (Offering Memorandum) අනුව බැඳුම්කර මුදලින් සියයට 50 ක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල, සියයට 25 ක් එක්සත් ජනපද ඩොලර් ඩිනොමිනේටඩ් ණයවල සහ සියයට 25 ක් ශ්‍රී ලංකා රුපියල් ඩිනොමිනේටඩ් ණයවල ආයෝජනය කිරීමට නියෝග කර තිබුණි. මුදල්වලින් සියයට 50 ක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කර තිබුණද, එජඩො මිලියන 15.5 ක් හෙවත් සියයට 8.3 ක් පමණක් 2013 දෙසැම්බර් 31 දිනට එජඩො ඩොලර් ඩිනොමිනේටඩ් ණයවල ආයෝජනය කර තිබුණි.

(ii) තවද, ශ්‍රී ලංකා රුපියල් ඩිනොමිනේටඩ් ණය සඳහා කිසිදු බැඳුම්කර මුදලක් 2013 දෙසැම්බර් 31 වන විට බැංකුව විසින් වියපැහැදම් කර නොතිබුණි.

**4.3 ඉදිකිරීම් වැඩ ප්‍රමාදවීම**

**--------------------------**

බැංකු ශාඛා ඉදිකිරීම සඳහා රු.144,509,414 ක් වටිනා පානදුර, බම්බලපිටිය හා මීගමුව පිහිටි ඉඩම් 2008 හා 2009 වර්ෂවලදී අත්පත් කර ගෙන තිබුණි. කෙසේ වුවද, 2013 දෙසැම්බර් 31 වන විටත් ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර නොතිබුණි. ඒ අනුව මෙම බැංකු ශාඛා පවත්වා ගෙනයාම සඳහා කුලියට ගත් ගොඩනැඟිලි සඳහා රු.27,405,300 ක කුලියක් ගෙවා තිබුණි. නිශ්චිත කාලපරිච්ඡේදය තුළදී ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කළේ නම් මෙම කුලි ගෙවීම් ඉතිරි කර ගත හැකිව තිබුණි.

**4.4 ණය පරිපාලනය**

**-------------------**

(අ) 2013 වර්ෂය සඳහා ලබා දුන් ණය සහ බැංකුවේ අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කරන ලද ණය පිළිබඳ විස්තර පෙර වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| ණය වර්ගය | 2013 මුළු ණය ණය සංඛ්‍යාව | 2013 මුළු ණය මුදල | 2013 අක්‍රීය ණය ණය සංඛ්‍යාව | 2013 අක්‍රීය ණය මුදල | 2012 මුළු ණය ණය සංඛ්‍යාව | 2012 මුළු ණය මුදල | 2012 අක්‍රීය ණය ණය සංඛ්‍යාව | 2012 අක්‍රීය ණය මුදල |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. මිලියන | | රු. මිලියන | | රු. මිලියන | | රු. මිලියන |
| අලංකාර ණය | 83 | 66.3 | 6 | 4.22 | 80 | 60.67 | 7 | 6.33 |
| වාහන ණය | 297 | 301.56 | 2 | 1.07 | 143 | 143.63 | 2 | 2.47 |
| වාණිජ ණය | 2 | 1,192.96 | - | - | 1 | 725.95 | - | - |
| විදේශ ණය | 233 | 387.02 | 61 | 111.34 | 207 | 392.35 | 43 | 85.58 |
| රජයේ ණය | 31,133 | 21,112.56 | 1,462 | 813.89 | 24,885 | 17,123.26 | 664 | 395.34 |
| නිවාස හා දේපල ණය | 31,034 | 22,962.48 | 4,116 | 2,172.77 | 31,077 | 22,250.85 | 3,643 | 1,995 |
| නිවාස හා දේපල ණය - මිහිඳු | 4 | 3.99 | 3 | 1.8 | 19 | 17.21 | 7 | 7.17 |
| ජාතික නිවාස සංවර්ධන - ජන සෙවන | 5 | 2,476.00 | - | - | 4 | 1,458.43 | - | - |
| ඇප මත පුද්ගලික ණය | 30,488 | 5,440.63 | 1,770 | 175.1 | 18,630 | 3,127.13 | 1,199 | 83.99 |
| උකස් මත පුද්ගලික ණය | 183 | 154.37 | 34 | 37.39 | 210 | 178.56 | 40 | 35.10 |
| ව්‍යාපෘති ණය | 21 | 15,872.53 | - | - | 12 | 7,664.22 | - | - |
| සේවක ණය | 10,133 | 3,232.94 | - | - | 10,015 | 3,012.86 | - | - |
| විශ්ව විද්‍යාල සේවක ණය | 191 | 174.49 | 78 | 6.55 | 63 | 51.75 | 1 | 1.00 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| රට ඉතුරු ණය | 574 | 33.32 | 427 | 20.57 | 638 | 29.30 | 482 | 18.70 |
| එකතුව | 104,381 | 73,411.15 | 7,959 | 3,344.72 | 85,984 | 56,236.19 | 6,088 | 2,630.68 |

පහත සඳහන් නිරික්ෂණය කරනු ලැබේ.

2012 හා 2013 වර්ෂවල මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස මුළු අක්‍රීය ණය වටිනාකම පිළිවෙලින් සියයට 4.7 ක් හා සියයට 4.5 ක් නියෝජනය වේ.

**(ආ) අයකර නොගත් සේවක ණය**

i. නිලධාරින් විශ්‍රාම යන අවස්ථාවේදී අයකර ගෙන නොතිබුණු 2013 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු ණයවල වටිනාකම රු.11,859,246 ක් විය.

ii. වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරින් 69 ක ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.6,746,567 ක මුදල 2013 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සේවක ණය යටතේ ඇතුළත් කර තිබුණි.

**(ඇ) නිවාස යෝජනා ක්‍රමයක් ඉදි කිරීම සඳහා ව්‍යාපෘති ණය ලබා දීම**

1996 වර්ෂය තුළදී ඉහත කාර්යය සඳහා සියයට 20 ක පොලී අනුපාතයකට රු. මිලියන 50 ක හා රු. මිලියන 30 ක් වූ ණය මුදල් දෙකක් පුද්ගලික සමාගමකට ලබා දී තිබුණි. මෙම ණය 1999 ජූලි වන විට සම්පූර්ණයෙන්ම නිරවුල් කර ගැනීමට අපේක්ෂා කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කිසිදු වාරිකයක් ගෙවීමෙන් තොරව සම්පූර්ණ ණය මුදලම හිඟ ලෙස පැවතුණි.

(ii) ඉහත ණය සම්බන්ධයෙන් බැංකුවට ගෙවන ලද පොලී මුදල් 2004 නොවැම්බර් 06 දිනට පිළිවෙලින් රු. 8,524,520 ක් හා රු.1,546,028 ක් විය.

(iii) 2006 මාර්තු 10 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, මෙම ණය වෙනුවෙන් අත්කරගත් දේපලවල ප්‍රමාණය අක්කර 6, රූඩ් 3 පර්චස් 21.75 ක් විය. කෙසේ වුවද අදාළ තක්සේරු වාර්තා සහ මැනුම් සැලසුම් අනුව දේපලවල ප්‍රමාණය අක්කර 6 රූඩ් 2 පර්චස් 12.8 ක් වූ බැවින් රූඩ් 1 පර්චස් 8.95 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iv) ඉහත ණය අයකර නොගැනීම හේතුවෙන්, බැංකුවට ලැබිය යුතු පොලී ආදායම හා ප්‍රාග්ධනය 2004 දෙසැම්බර් 31 දිනට රු. 185,400,000 ක් විය.

(v) රු. මිලියන 184 ක් වටිනාකම වූ ඉහත දේපලවල කොටසක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවරාගෙන තිබූ අතර, රු. මිලියන 113 ක් වටිනා දේපල බැංකුවට අයත් විය. කෙසේ වුවද බැංකුව විසින් ලබාගත් තක්සේරු වාර්තාව අනුව එය රු. මිලියන 70.3 ක් පමණක් වූ හෙයින් රු.මිලියන 9.7 ක පාඩුවක් බැංකුව විසින් දරා තිබුණි.

(vi) ඉහත ඉඩම්වලින් රු. මිලියන 18.8 ක් වටිනා ඉඩම් කොටස් 4 ක් රජය විසින් 2009 ජුනි 2 දිනැති අංක 1604/16 හා 2011 ජුනි 02 දිනැති අංක 1708/24 දරන අති විශේෂ ගැසට් පත්‍ර මගින් අත්කරගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් කිසිදු වන්දි මුදලක් රජය විසින් මේ දක්වා ගෙවා නොතිබුණි.

**(ඇ) උකස් අත්තිකාරම්**

----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 2013 වර්ෂය තුළදී වෙළඳපොළේ රන් මිල අඛණ්ඩව පහතයාම හේතුවෙන් උකස් අත්තිකාරම්වල වෙළඳපොළ වටිනාකම ක්‍රමයෙන් පහත වැටී තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය තුළදී මහජන වෙන්දේසි තුනක් පවත්වා තිබුණද, රු.මිලියන 3,995.4 ක් වටිනා බේරානොගත් උකස් භාණ්ඩ 52,354 ක් වෙන්දේසි කිරීමෙන් තොරව බැංකුව භාරයේ පැවතුණි.

iii. රන් භාණ්ඩ උකස් කිරීම සම්බන්ධයෙන් ශාඛා 09 ක සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී සම්මත අනුපාතයට වඩා අඩු අනුපාතයක වූ රන් සඳහා අවස්ථා 68 කදී රු.22,124,812 ක් වූ ගෙවීම් කර තිබූ බව අනාවරණය විය.

**4.5 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු ශාඛා 24 ක අරමුදල් සාවද්‍යා පරිහරණය රු.23,193,414 ක් විය. මෙයින් සියයට 7 ක් වර්ෂ 5 කට වැඩි කාලපරිච්ඡේදයකට අදාළ විය. වර්ෂ 01 ඉක්මවූ මුළු මුදල සාවද්‍යාව පරිහරණය කරන ලද සමස්ත මුදලින් සියයට 54 ක් විය.

(ආ) රු.44,883,096 ක් පිරිවැය වූ ගොඩනැඟිලි වැඩබිම් 8 ක් කිසිදු ඉදිකිරීමක් සිදුකිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩවල ඇතුළත් කර තිබුණි.

(ඇ) 2013 වර්ෂය තුළදී සිදුකිරීමට අපේක්ෂා කරන ලද පහත සඳහන් ඉලක්කයන් ඉටුකර ගැනීමට බැංකුව අපොහොසත්ව තිබූ බව නිරික්ෂණය විය.

| විෂයය | ඉලක්කය | ඉටුකර ගැනීම | ඉටුකර නොගැනීම |
|---|---|---|---|
| තැන්පතුවල වර්ධනය | සියයට 14 | සියයට 10 | සියයට 4 |
| මුළු තැන්පතු (රු.බිලියන) | 560 | 502 | 58 |
| වත්කම් මත ප්‍රතිලාභ (වාර ගණන) | 1.8 | 0.18 | 1.62 |
| බදුවලට පෙර ලාභය (රු.බිලියන) | 7.1 | 2.3 | 4.8 |
| එක් සේවකයකුට තැන්පතු (රු.මිලියන) | 183 | 170 | 13 |
| එක් සේවකයකුට ලාභ (රු.මිලියන) | 2.32 | 0.8 | 1.52 |

## 4.6 වංචනික ස්වභාවයේ ගනුදෙනු

විගණනයේදී නිරික්ෂණය වූ වංචනික ස්වභාවයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශාඛාව | | ගනුදෙනුවේ ස්වභාවය | වටිනාකම | | අභ්‍යන්තර පාලනයේ නිරික්ෂණය වූ දුර්වලතා |
|---|---|---|---|---|---|
| | | | රු.මිලියන | | |
| බදුල්ල | (අ) | ව්‍යාජ භාණ්ඩ | 8.6 | i. | නිලධාරින්ට ලබාදී තිබූ "පාස්වර්ඩ්" හි රහස්‍යභාවය ආරක්ෂා කිරීමට නොහැකිවීම. |
| | | | | ii. | ගනුදෙනුකරුවන්ගේ අත්සන පිළිබඳ නිරවද්‍යතාවය ශාඛාවේ අදාළ නිලධාරින් විසින් පරික්ෂා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නොකිරීම. |
| | | | iii. | දිනය අවසානයේදී කළමනාකරු විසින් උකස් භාණ්ඩ පිළිබඳ දෛනික භෞතික පරික්ෂාවක් සිදු නොකිරීම. |
| | | | iv. | සේප්පුවේ යතුරු භාරව සිටින නිලධාරින් විසින් උකස් භාණ්ඩ සේප්පුවට යැවීමට පෙර පරික්ෂා කිරීමට අපොහොසත් වීම. |
| | | | v. | උකස් භාණ්ඩ සඳහා අත්තිකාරම් ලබාදීමේදී මූලාශ්‍ර ලියකියවිලි ලබාගැනීමට නොහැකිවීම. |
| (ආ) | ස්ථාවර තැන්පතු මත ණයලබාදීම | 8.7 | i. | ගිණුම් විවෘත කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලිය එකම නිලධාරියකු / සේවකයකු විසින් සිදුකිරීම. |
| | | | ii. | ස්ථාවර තැන්පතු මත ණය ලබාදීම සඳහා අදාළ ලියකියවිලි හා වවුචර් පිළිබඳ දෛනිකව විගණනයක් සිදුනොකිරීම. |
| | | | iii. | ස්ථාවර තැන්පතු සහතික පිළිබඳ තොග ලේඛනය විධිමත්ව පවත්වා ගැනීමට අපොසත්වීම හා ස්ථාවර තැන්පතු සහතික තොගයට අදාළව ප්‍රමාණවත් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | අභ්‍යන්තර පාලනයක් නොමැතිවීම. |
| රත්නපුරය | (අ) | මියගිය පුද්ගලයන්ට අයත් ස්ථාවර තැන්පතු වංචනිකව ආපසු ගැනීම | 4.34 | i. | පොයින්ට් ඔෆ් සේල්ස් (Point of Sales ) යන්ත්‍රය මඟින් මෙම ගිණුම් විවෘත කිරීම තහනම් කර තිබුණද නව ගිණුම් මෙම යන්ත්‍ර මඟින් විවෘත කිරීමට ඉඩදීම. |
| | | | | ii. | කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් පාසැල් හැර යන්නන් හා කාර්යාල සහකරුවන් මුදල් අයකැමිවරුන් ලෙස පත් කිරීමට ඉඩදී තිබීම. |
| | (ආ) | වංචනික මුදල් ආපසු ගැනීම් | 0.51 | i. | වගකිව යුතු නිලධාරීන් විසින් වසා දැමුණු ගිණුම් පිළිබඳ ලේඛනය පරීක්ෂා කිරීමට අපොහොසත්වීම සහ දෛනික පදනම මත විගණනය නොකිරීම. |
| | | | | ii. | ස්ථාවර තැන්පතු ගිණුම් වසා දැමීමේදී ස්ථාවර තැන්පතු සහතික අවලංගු කිරීම හා ගොනුගත කිරීමට නොහැකිවීම. |
| | | | | iii. | බැංකු කටයුතුවලදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද කාර්යාල සහකරුවන් යොදා ගැනීම සේවා ගිවිසුම්වලින් ඉඩදී එයට ඉඩදී තිබීම. |

iv. බැංකු පාස්පොත් තොගය ආරක්ෂිතව හා විධිමත් අධීක්ෂණය යටතේ පවත්වා ගැනීමට නොහැකිවීම. තවද පාස්පොත් තොග ලේඛනය දෛනිකව යාවත්කාලීන නොකිරීම.

v. නිසි සැලකිල්ලක් නොමැතිව කාර්ය මණ්ඩලයට තැන්පතු භාර ගැනීමට හා ගෙවීම් කිරීමට ඉඩදී තිබීම.

## 4.7 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකුව විසින් 2009 ජනවාරි 29 දින මිලදී ගෙන තිබුණු රු.මිලියන 35 ක් වටිනාකම වූ හෙක්ටයාර් 0.479 ක වැතැම් විදියේ පිහිටි ඉඩම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්පත් කර ගෙන තිබුණි. ඉඩම අත්පත් කර ගැනීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර තිබුණු අතර, වන්දි ගෙවීම සඳහා පරික්ෂා කිරීම 2012 ජුනි 28 දින සිදුකර තිබුණි. ඒ සඳහා වන්දි හා පොලී ගෙවීම පරික්ෂණ දිනයේ සිට වටිනාකම මත ගෙවන බවට කොළඹ ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් කිසිදු වන්දි ගෙවීමක් ලැබී නොතිබුණි.

(ආ) බැංකුව සඳහා මහල් 18 ක ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට 2008 වර්ෂයේ සිට රු.35,228,367 ක මුදලක් වැයකර තිබුණි. මෙම ප්‍රදේශය අධි ආරක්ෂිත කලාපයක පිහිටීම හේතුවෙන් පෙර වර්ෂ තුළදී කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබු නමුත් කෙරීගෙන යන වැඩවල දක්වා තිබුණි. එබැවින් මේ සඳහා දරන ලද වියදම නිශ්ඵල වියදමක් ලෙස දැක්විය හැක.

**4.8 ආයෝජන**

**------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට මිල ප්‍රකාශිත සමාගම් 55 ක කොටස්වල මුළු ආයෝජන පිරිවැය රු.7,950,328,654 ක් විය. මෙයින් සියයට 35.4 ක් නියෝජනය වන රු.2,814,456,826 ක මුදලක් දීර්ඝ කාලීන පදනම මත මිල ප්‍රකාශිත සමාගම් 3 ක ආයෝජනය කර තිබුණි. මිල ප්‍රකාශිත සමාගම් 55 කින් සමාගම් 49 ක කොටස්වල වෙළඳපොළ වටිනාකම 2013 වර්ෂය තුළදී රු.1,922,908,845 කින් හීනවී තිබූ අතර සමාගම් 6 ක පමණක් කොටස්වල වෙළඳපොළ වටිනාකම රු.220,049,608 කින් වැඩිවී තිබුණි. ඒ අනුව ආයෝජනය කරන ලද සමස්ත කොටස්වල වෙළඳපොළ වටිනාකම 2013 දෙසැම්බර් 31 දිනට රු.1,702,859,237 කින් හීනවී තිබුණි. වෙළඳපොළ වටිනාකම හීන වී තිබූ සමාගම්වල ආයෝජන පිරිවැය 2013 දෙසැම්බර් 31 දිනට රු.5,593,802,836 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට රු.1,267,575,023 ක් වූ මිල ප්‍රකාශිත නොවන ඒකක සුරැකුම් 4 ක් පැවතුණි. රු.57,363,543 ක් වූ එක් ඒකක සුරැකුමකින් ලාභාංශ ආදායම රු.6,090,000 ක් පමණක් විය. ඒ අනුව 2013 වර්ෂයේදී මිල ප්‍රකාශිත නොවන ඒකක සුරැකුම් මත මුළු ප්‍රතිලාභය සියයට 0.48 ක අඩු වටිනාකමක් විය.

(ඇ) ඒකක සුරැකුම් 03 ක කරන ලද රු.1,210,211,480 ක ආයෝජන සම්බන්ධයෙන් 2011, 2012 හා 2013 වර්ෂ සඳහා 2013 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. මෙම ආයෝජනවල ඇතුළත් රු.1,136,500,000 ක ආයෝජනයෙන්ද 2010 වර්ෂය සඳහා කිසිදු ප්රතිලාභයක් ලැබී නොතිබුණි.

(ඈ) රු.10,000,000 ක ඒකක හිමිකම් අරමුදල (ඒකක භාර ) මත මුළු ප්‍රතිලාභය, මුළු පවත්වා ගැනීමේ කාලය සඳහා (වර්ෂ 20) වර්ෂයකට සියයට 3.85 ක් නියෝජනය වන රු..7,550,307 ක් පමණක් විය. පසුගිය වර්ෂ 21 ක් තුළ ස්ථාවර තැන්පතු සඳහා බැංකුව විසින් ගෙවන ලද සාමාන්‍ය වාර්ෂික පොලී අනුපාතය සියයට 11 සිට සියයට 13 දක්වා විය. ඒ අනුව ගනුදෙනුකරුවන්ට ගෙවන ලද සාමාන්‍ය පොලී අනුපාතය සැලකීමේදී ඒකක භාර මත ප්‍රතිලාභ රු.14,033,589 සිට රු.17,959,068 ක් දක්වා බැංකුව විසින් අහිමි කර ගෙන තිබුණි.

**4.9 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ගය | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| විධායක ශ්‍රේණි | 833 | 626 | 207 |
| අධීක්ෂණ ශ්‍රේණි | 919 | 630 | 289 |
| මාණ්ඩලික නොවන ශ්‍රේණි | 1,952 | 1,602 | 350 |
| කණිෂ්ඨ සේවක | 52 | 50 | 02 |
| වෙනත් (කොන්ත්‍රාත් පදනම මත) | - | 54 | - |
| එකතුව | 3,756 | 2,942 | 848 |

සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව 3,756 ක් වූ අතර 2013 වර්ෂය තුළදී බැංකුව විසින් සේවකයන් 2,908 ක් ස්ථිර පදනම මත සහ විධායක ශ්‍රේණියේ තනතුරු 02 කින් හා විධායක නොවන ශ්‍රේණි තනතුරු 32 කින් සමන්විතව සේවකයන් 34 ක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. තවද, තනතුරු 848 ක් පිරවීම සඳහා 2013 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් බැංකුවේ සභාපතිනියගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය

(ඇ) ණය පරිපාලනය

(ඈ) ඉන්වෙන්ට්‍රි පාලනය

(ඉ) ලේඛනගත කිරීම හෝ ප්‍රලේඛනය

(ඊ) නීති, රිති හා රෙගුලාසිවලට අනුකූලවීම

(උ) වත්කම් කළමනාකරණය

(ඌ) ගනුදෙනුකාර ගිණුම් විවෘත කිරීම හා වසා දැමීම